**කෘෂිකර්ම දෙපාර්තමේන්තු තාක්ෂණික චක්‍රලේඛ 01/2018**

මගේ අංකය :පා/1/2/5/4
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.
2018.12. 03.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සියලුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියලුම අධ්‍යක්ෂවරුන්/ ප්‍රධාන ඉංජිනේරු,
ප්‍රධාන ගණකාධිකාරී/ ප්‍රධාන අභ්‍යන්තර විගණක,
පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්/ ප්‍රධාන කෘෂි විශේෂඥ / ප්‍රධාන කෘෂි විද්‍යාඥ,
අතිරේක අධ්‍යක්ෂවරුන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් (අන්තර්පළාත් (මොණරාගල/ පොළොන්නරුව/
අනුරාධපුර/ අම්පාර/ හසලක/ හම්බන්තොට) ).
සහකාර අධ්‍යක්ෂවරුන්,
ස්ථාන භාර නිලධාරීන්,
ඒකක / ශාඛා ප්‍රධානීන්.

**<u>සේනා දළඹුවා පාලනය කිරීමේ ක්ෂේත්‍ර වැඩසටහන සඳහා උපදෙස්</u>**

සේනා දළඹුවා නමැති පළිබෝධකයා ගේ ක්‍රියාකාරීත්වය හේතුවෙන් වර්තමාන කෘෂිකාර්මික ක්ෂේත්‍රයට සිදු ව ඇති හානිදායක බලපෑම අවම කර ගැනීම උදෙසා සමස්ත කෘෂිකාර්මික ප්‍රජාව විසින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පිළිබඳ මාර්ගෝපදේශ සහිතව මෙම දෙපාර්තමේන්තු තාක්ෂණික චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

1. සේනා දළඹුවා (*Spodoptera frugiperda*) ශ්‍රී ලංකාවට ආක්‍රමණශීලී, ආගන්තුක පළිබෝධකයෙක් වන බැවින් වහාම මර්ධනය කිරීම සඳහා පියවර ගත යුතුය. මේ සඳහා සියලු පළිබෝධ මර්ධන ක්‍රම අනුගමනය කිරීමට ගොවීන් උනන්දු කළ යුතුය. මේ සඳහා පළාත්/ අන්තර් පළාත්/ මෙන්ම මහවැලි ව්‍යාපෘති කාර්යය මණ්ඩලය ද කාර්යක්ෂමව හා කඩිනමින් ක්ෂේත්‍රගත වී කටයුතු කළ යුතුව ඇත.
2. ක්ෂේත්‍ර කාර්යය මණ්ඩලය කොටස් දෙකකට බෙදා එක් කණ්ඩායමක් ක්ෂේත්‍රයේ දැනුවත් කිරීම් සඳහා සුදුසු ජ්‍යෙෂ්ඨ ක්ෂේත්‍ර නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ කටයුතු කිරීමට සැලැස්විය යුතු අතර, අනෙක් කණ්ඩායම එවැනිම ජ්‍යෙෂ්ඨ ක්ෂේත්‍ර නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ පළිබෝධකයා මර්ධනය කිරීමේ කටයුතු කිරීමට සැලැස්විය යුතුය.
3. මර්දනය සඳහා සුදුසු පළිබෝධනාශක ලැයිස්තුවක් තාක්ෂණ නිර්දේශයක් යටතේ මේ වන විටත් ඔබ වෙත ලැබීමට සලස්වා ඇති අතර, එම පළිබෝධනාශක ශ්‍රී ලංකාව තුළ බෙදා හරිනු ලබන සමාගම් ලැයිස්තුව ද ඒ සමඟම ලැබීමට සලස්වා ඇත. එම පළිබෝධනාශක ලැයිස්තුවේ ඇති පළිබෝධනාශක ක්‍රියාකාරී කාණ්ඩ 03 කට අයත් වන අතර, එක් පළිබෝධනාශකයක් යෙදූ ක්ෂේත්‍රයකට නැවත මෙම ලැයිස්තුවෙන් පළිබෝධනාශකයක් යොදන්නේ නම් මුල් පළිබෝධනාශකය අඩංගු ක්‍රියාකාරී කාණ්ඩයේ නොවන පළිබෝධනාශකයක් යෙදීමට කටයුතු කළ යුතුය.
4. පළිබෝධ හානිය වාර්තා වූ අවස්ථාවේදීම ව්‍යාපෘති හා පුහුණු අංශය මගින් රසායනික මර්දනය සම්බන්ධයෙන් ව්‍යාපෘති වාර්තාවක් සකස් කර ඒ සඳහා අනුමැතිය ලබාගෙන ඇති අතර, දැනටමත් අන්තර් පළාත් සහ පළාත්වල ලබා දී ඇති ප්‍රතිපාදන එම ව්‍යාපෘතිය හරහා ලැබී ඇත.
5. මේ සඳහා දැනටමත් කාර්යය සාධන බලකායක් පත් කර ඇති අතර, එම කාර්යය සාධන බලකාය මගින් ලබා දෙනු ලබන තීරණ සහ වැඩසටහන් සඳහා ඔබගේ පූර්ණ මැදිහත්වීම සහ සහයෝගය ලබා දිය යුතුය.

6. මෙම මර්දන කටයුතු සඳහා අවශ්‍ය වන පළිබෝධනාශක ප්‍රාදේශීය ප්‍රසම්පාදන මණ්ඩල මඟින් මිළ දී ගත යුතු අතර, ආසාදනය පවතින ගොවි ක්ෂේත්‍රයකට අවශ්‍ය වන පළිබෝධනාශක වලින් අඩක් නොමිලේ සපයමින් මර්දන වැඩපිළිවෙල දියත් කළ යුතුය. ඉතිරි කොටස යෙදීමට ගොවියා පෙළඹවීම ඉතා වැදගත් බව පෙන්වා දෙමි.

7. අන්තර් පළාත් බල ප්‍රදේශ වලට වෙන් කරන ලද ප්‍රතිපාදන අධ්‍යක්ෂ (වයාප්ති හා පුහුණු) මධ්‍යස්ථානයේ ඇති අතර විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කරමින් මිලදී ගනු ලබන පළිබෝධනාශක සුදුසු නිර්දේශ සහිතව, ගොවියා වෙත නිවැරදිව අදාල පළිබෝධනාශකය ලබා දුන් බවට තහවුරු කරන ලේඛන ද සමඟ ඉදිරිපත් කිරීමෙන් මිළ දී ගත් ආයතන සඳහා ගෙවීම් කටයුතු සිදු කළ යුතුය.

8. පළාත් අධ්‍යක්ෂ කාර්යාල මඟින් හෝ පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාල මඟින් විධිමත් ප්‍රසම්පාදන ක්‍රම අනුගමනය කරමින් මිලදී ගත්, පළිබෝධනාශක සඳහා ගෙවීම් කටයුතු කිරීමේදී දැනටමත් ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහනේ වියදම් ප්‍රතිපූර්ණය කරන ආකාරයට සුදුසු නිර්දේශ සහිතව ගොවියා වෙත නිවැරදිව අදාල පළිබෝධනාශකය ලබා දුන් බවට තහවුරු කරන ලේඛන ද සමඟ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රගති මෙහෙයුම් අංශයට ඉදිරිපත් කිරීමෙන් මිළ දී ගත් ආයතන සඳහා ගෙවීම් කටයුතු සිදු කළ යුතුය.

9. එක් පළිබෝධනාශකයක් යෙදූ පසු එම ක්ෂේත්‍රයෙන් නැවත පළිබෝධ හානිය වාර්තා වන්නේ නම් එම ක්ෂේත්‍රයටම එම ගොවියාටම වෙනත් ක්‍රියාකාරී කාණ්ඩයක පළිබෝධනාශකයක් යෙදිය යුතුය. එහිදී ද හරි අඩක් ගොවියා විසින් සපයා ගත යුතුය.

10. සේනා දළඹු හානියේ ඇති ව්‍යාපසරිය, හානියේ තීව්‍රතාවය හා පාලනය කිරීමේ වැඩසටහන්වල ප්‍රගතිය ඉතා කඩිනමින් ලබා ගැනීම සඳහා පළාත්, අන්තර් පළාත් සහ මහවැලි ප්‍රදේශ වල සුදුසු සම්බන්ධීකරණ නිලධාරියෙකු පත් කර, ඔහුගේ නම, තනතුර, දුරකථන අංකය (ජංගම සහ ස්ථාවර) හා විද්‍යුත් තැපැල් ලිපිනය මා වෙත කඩිනමින් ලැබීමට සැලැස්විය යුතුය. එමෙන්ම පත් කරන ලද නිලධාරියා හට ලිඛිතව වගකීම භාර දිය යුතුය.

11. 1999 අංක 35 දරන ශාක ආරක්ෂක පනත අනුව, මෙම සේනා දළඹුවා ගේ පැතිරීම අවම කිරීම සඳහා, ආසාධිත වූ බඩ ඉරිඟු ඇතුලු බෝග කොටස් එම ප්‍රදේශ වලින්, අනෙකුත් ප්‍රදේශ කරා රැගෙන යාමේදී, ආසාධිතයන් මර්ධනය කර, ආරක්ෂිතව ප්‍රවාහනය කිරීම සිදු කළ යුතු ය.

12. සේනා දළඹුවාගේ ක්‍රියාකාරීත්වය මැඩපවත්වා, වගා හානි අවම කරගැනීම සඳහා, ඉහත මාර්ගෝපදේශ පරිදි, ඔබගේ උපරිම දායකත්වය ලබා දෙමින් කැපවීමෙන් යුතුව කටයුතු කරන ලෙස වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

ආචාර්ය ඩබ්.එම්.ඩබ්. වීරකෝන්.
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත් :-

01. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය. : - කාරුණික දැන ගැනීමට සහ උක්ත කරුණ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කිරීමට කටයුතු කිරීම සඳහා.

02. ප්‍රධාන ලේකම් (වයඹ, උතුරු මැද, ඌව, නැගෙනහිර)
03. අතිරේක ලේකම් (සංවර්ධන / කෘෂි තාක්ෂණ)
04. ලේකම්, පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය. (වයඹ, උතුරු මැද, ඌව,නැගෙනහිර)
05. පළාත් අධ්‍යක්ෂ,කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (වයඹ, උතුරු මැද, ඌව, නැගෙනහිර)

} කාරුණික දැන ගැනීමට සහ අවැසි කටයුතු සඳහා.